උ.ප.රා.සේ.කො.ස චක්‍රලේඛ අංක:12/2025

මගේ අංකය:NP/07/10/01/188
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය
2025.04.24

ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය
පළාත් ඉඩම් කොමසාරිස්
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
උතුරු පළාත

**උතුරු පළාත් තාක්ෂණික සේවයේ ජනපද නිලධාරි III වන ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම - 2025**

උතුරු පළාත් මුදල්, ක්‍රමසම්පාදන හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/05/01/LDE/L.GEN/020 දරණ 2025.03.06 දිනැති ලිපිය මගින් යොමුකරන ලද ඉල්ලීම ප්‍රකාරවත්, ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/NPC/A14/Land/CO/App/2024 දරණ 2024.11.12 දිනැති ලිපියෙන් ලද අනුමැතිය ප්‍රකාරවත්, උතුරු පළාත් තාක්ෂණික සේවයේ ජනපද නිලධාරි III වන ශ්‍රේණියේ පවතින තනතුරු පුරප්පාඩු සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව මෙම චක්‍රලේඛයෙහි සඳහන් සියලුම සුදුසුකම් සහිත උතුරු පළාත් ඉඩම් ක්ෂේත්‍ර උපදේශක තනතුරෙහි රාජකාරි කරනු ලබන නිලධාරින්හට මේ සඳහා අයදුම් කළ හැකිය. මෙම බඳවාගැනීම සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025 ජුනි මස දී පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2025.05.25** වේ.

**02.** බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1. උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරන ලද ජනපද නිලධාරි තනතුරට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සහ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති අනුකූලව තෝරාගන්නා අයදුම්කරුවන් පළාත් ජනපද නිලධාරි සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

02.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් පත්වීම සඳහා සුදුසුකම් සපුරන ලද අපේක්ෂකයන් පත්වීම් දින සිට වසරක වැඩ බැලීමේ කාලයකට යටත්වන පදනම මත ජනපද නිලධාරි III වන ශ්‍රේණියට පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි ජනපද නිලධාරි සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර 03 ක් ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය.

02.3. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් "උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය" යන කොන්දේසියට යටත් විය යුතුය.

02.4. පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය. මෙම තනතුර සඳහා 2024.12.31 දින වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් **50% (පුරප්පාඩු 08 ක්)** සීමිත තරඟ විභාගය මගින් සම්පූර්ණ කරනු ලැබේ.

02.5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දිනයේ සිට වසර 03 ක් අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

**03. වැටුප් පරිමාණය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ප්‍රකාර **MN 3-2025** අනුව ජනපද නිලධාරි තනතුරේ III වන ශ්‍රේණියේ තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය රු.**52,250 -10 X 800/= - 11 X 1190/= - 10 X 1320/= - 10 X1350/= - 100,040/=** ක් වේ.

**04. සාමාන්‍ය සුදුසුකම්**

04.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

04.2. අයදුම්කරු උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුතු විය යුතු අතර ම, මනා චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

04.3. අයදුම්කරු, මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර මෙහි සඳහන් **සියලුම සුදුසුකම්** සපුරා තිබිය යුතුය.

04.4. සීමිත තරඟ විභාගයක් මගින් බඳවා ගන්නා විට උපරිම **වයස් සීමාව** අදාළ නොවේ.

**05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්**

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් **එක් වරක දී** (සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව), ගණිතය/අංක ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් (06) සමත්ව තිබිය යුතුය.

**සහ**

**(ආ) වෘත්තීය සුදුසුකම්**

කුණ්ඩසාලේ, වවුනියාව, අම්පාර හාඩි උසස් තාක්ෂණික විද්‍යාලය ආදී ආයතන අතරින් එක් ආයතනයකින් ලබාගත් වසර දෙකක (02) ට නොඅඩු කෘෂිකර්මය පිළිබඳව ඩිප්ලෝමා සහතිකයක් හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබිය යුතුය.

**නැතහොත්**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙන් ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) 06 (හය) මට්ටමේ කුසලතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**(ඇ) සේවා පළපුරුද්ද**

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉඩම් ක්ෂේත්‍ර උපදේශක තනතුරේ III ශ්‍රේණියේ වසර දහයක (10) සේවා පළපුරුද්දක් අයදුම්කරු සපුරා තිබිය යුතු අතර, අවම වශයෙන් නව පත්වීම් දිනයට පූර්වාසන්න වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**06.** **බඳවා ගැනීමේ පරිපාටිය**

06.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් දක්ෂතාවය මත, බඳවා ගන්නා මොහොතේ බලාත්මක රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටි, රාජ්‍ය හා පළාත් රාජ්‍ය ප්‍රතිපත්ති යනාදිය ප්‍රකාරව **ජනපද නිලධාරි** තනතුරට බඳවා ගනු ලැබේ. මෙම නිවේදනය මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සුදුසුකම් සහ අදාළ ලියකියවිලි පරීක්ෂා කරනු ලැබේ.

06.2. ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන්ගෙන්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලැබූ වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව පත්වීම් සඳහා තෝරාගනු ලැබේ.

**07.** **විභාග ගාස්තු**

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස රු.500/= මුදලක් උතුරු පළාතේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකින් **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත** යන නමට යාපනය තැපැල් කාර්යාලයෙන් මාරුකළ හැකි වන පරිදි මුදල් ඇණවුමකින් ගෙවා, අදාළ කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

**08.** **අයදුම්කිරීමේ පිළිවෙල**

08.1. මෙම නිවේදනය සමග නිකුත් කරනු ලබන අයදුම්පත සම්පූර්ණ කර 2025.05.14 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් හෝ භාරදිය යුතුය.

08.2. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **“ NP/07/10/01/188 - 2025 ”** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3. මෙම තනතුරට අයදුම්කරන අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුය. ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ නොකරන ලද අයදුම්පත් පිළිගනු නොලැබේ.

08.4. ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය පිළිගනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය වන සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

08.5. අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක. එසේ ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් පිළිබඳව උතුරු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් දන්වා එවනු ලැබේ.

08.6. අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 කට වත් පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **“ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය”** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939**, ෆැක්ස් අංකය - **021-2219940**, විද්‍යුත් තැපෑල - **examppscnp@gmail.com**)

- ඉල්ලීම් ලිපිය
- පරීක්ෂණයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ඇත්නම් මුදල් ඇණවුමේ සහතික කළ පිටපතක්
- විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ෆැක්ස් අංකය

**09. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම**

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත්විය හැකි පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කුමක් හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii). වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii). වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය.

**10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්**

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන විට හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

**11. අත්සන සහතික කිරීම**

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. අයදුම්කරු තම ආයතන ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් තම අත්සන සහතික කරවා ගත යුතුය.

**12.** විභාග පරිපාටිය

මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පහත සඳහන් කරුණුවලින් සමන්විත වනු ඇත.

| අංකය | තෝරාගන්නා ආකාරය | ලකුණු | සටහන |
|---|---|---|---|
| 01 | සේවා පළපුරුද්ද සහ ජ්‍යෙෂ්ඨත්වය | 90 | සක්‍රීය හා සතුටුදායක සේවා කාලය තුළ දී සෑම වසරකටම ලකුණු පහ (05) බැගින් ලබාදෙනු ලැබේ. තවද මෙම සක්‍රීය හා සතුටුදායක සේවා කාලය මාස හයකට (06) වැඩි නමුත් වසරකට වඩා අඩුනම්, ඒ සඳහා ලකුණු දෙකහමාරක් (2.5) ලබාදෙනු ලැබේ. කෙසේ වෙතත් මාස හයකට වඩා අඩු සේවා කාලයකට කිසිදු ලකුණක් ලබාදෙනු නොලැබේ. |
| 02 | සම්මුඛ පරීක්ෂණය | 10 | ආකල්ප, සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය සහ පිළිතුරු ලබාදීම. |

**13.** මෙම තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හෝ අවලංගු කිරීම හෝ **පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ල සම්පූර්ණ කිරීමේ** බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය කොමිෂන් සභාවේ ලේකම් සතුය.

**14.** අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් උතුරු පළාත් සභා නිළ වෙබ් අඩවියේ (www.np.gov.lk) පළ කරනු ලැබේ.

සැළකිය යුතුයි

i. මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

ii. මෙම කරුණ සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

iii. මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

iv. මෙම චක්‍රලේඛය ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලය යටතේ සේවය කරනු ලබන පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර උපදේශක තනතුරේ නිලධාරීන්ගේ අවධානයට යොමුකරනු මැනවි.

**පී.කුගනාදන්**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
2025.04.24